**උපාය මාර්ගික නගර සංවර්ධන ව්‍යාපෘතිය - 2019**

**-------------------------------------------------------**

උපාය මාර්ගික නගර සංවර්ධන ව්‍යාපෘතියේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවියයුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ජාත්‍යන්තර සංවර්ධන සංගමය අතර එළඹි 2014 සැප්තැම්බර් 12 දිනැති අංක 5428 - එල්කේ දරන මූල්‍ය ගිවිසුමේ II (බී)(3) වගන්තිය හා 2016 ජූලි 20 දිනැති අංක 5800 - එල්කේ දරන අතිරේඛ මූල්‍ය ගිවිසුම ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘතියේ කාල සීමාව**

**------------------------------------------------------------------------------------------**

මූල්‍ය ගිවිසුම අනුව, එවකට නාගරික සංවර්ධන, සහ නිවාස අමාත්‍යාංශය, වර්තමාන මහානගර හා බස්නාහිර පළාත් සංවර්ධන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර නාගරික සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ව්‍යාපෘතියේ අරමුණ වන්නේ ශ්‍රී ලංකාවේ සහභාගීත්ව නගර කලාපවල තෝරාගත් නාගරික සේවා හා පොදු නාගරික ස්ථාන වැඩිදියුණු කිරීමයි. මූල්‍ය ගිවිසුමට අනුව ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු. මිලියන 34,912.48 කට සමාන එ.ජ.ඩොලර් මිලියන 257.08 ක් වන අතර ඉන් රු. මිලියන 27,507 කට සමාන එ.ජ.ඩොලර් මිලියන 202 ක් සැපයීමට ජාත්‍යන්තර සංවර්ධන සංගමය එකඟ වී තිබුණි. ඉතිරි රු.මිලියන 7,405.48 ක මුදල ශ්‍රී ලංකා රජය මඟින් මූල්‍යනය කිරීමට නියමිතය. ව්‍යාපෘතිය එහි කටයුතු 2014 මැයි 05 දින ආරම්භ කරන ලද අතර 2019 දෙසැම්බර් 31 දින වන විට නිමකිරීමට නියමිතව තිබුණි. එසේ වුවත් ව්‍යාපෘතියේ කටයුතු නිම කිරීමේ කාලය 2021 දෙසැම්බර් 31 දින දක්වා දීර්ඝ කර තිබුණි.

**1.3 මතය**

**------**

මෙම වාර්තාවේ 2.1 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, ව්‍යාපෘතියෙහි 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.4 මතය සඳහා පදනම**

**---------------------**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදුකරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනම සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමණාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම**

**------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමණාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී ව්‍යාපෘතිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය ව්‍යාපෘතිය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර

අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ව්‍යාපෘතියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි. ව්‍යාපෘතියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබා දීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතික වීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිත ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා හා වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑමට නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැක මුසු බවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී තක්සේරු කිරීමේදී අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදු කරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මඟින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛණ සැකසීම,චේතනාන්විත මඟ හැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇතිවීමට හේතු වේ.

- අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද මුත් අභ්‍යන්තර පාලනයේ ඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තු වල සාධාරණත්වය සහ කළමණාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක් කළ අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බවට අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.1 ගිණුම්කරණ අඩුපාඩු

| ගිණුම්කරණ අඩුපාඩුව | බලපෑම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණනයේ නිර්දේශය |
| --- | --- | --- | --- |
| ඉඩම් අත්පත් කර ගැනීම වෙනුවෙන් ගෙවිය යුතු රු.මිලියන 13.41 ක් සඳහා 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල ප්‍රතිපාදනයන් සිදුකර නොතිබුණි. | ගෙවිය යුතු මුදල් මූල්‍ය ප්‍රකාශනවල අඩුවෙන් දැක්වීම. | මූල්‍ය ප්‍රකාශනවල ප්‍රතිපාදනයන් සිදුකර නොමැත. | වර්ෂය අවසානයට ගෙවිය යුතු මුදල් මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතුය. |

## 3. භෞතික කාර්යසාධනය

### 3.1 ව්‍යාපෘතියේ වැඩ කටයුතුවල භෞතික කාර්යසාධනය

මහනුවර, ගාල්ල හා යාපනය යන සහභාගීත්ව නාගරික ප්‍රදේශයන් තුළ නාගරික යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ කටයුතු ක්‍රියාත්මක කිරීමට ව්‍යාපෘතිය සැලසුම් කර තිබුණු අතර එම කාර්යයන් සම්බන්ධව පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | සංරචකය | කාර්යය | විගණන නිරීක්ෂණ | බලපෑම | ප්‍රමාදයට හේතුව | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණනයේ නිර්දේශය |
| --- | --- | --- | --- | --- | --- | --- | --- |
| (අ) | මහනුවර නගර ප්‍රදේශය තුළ මැදිහත් වීම් | මහනුවර මඩවල මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම හා වැඩිදියුණු කිරීම. | මහනුවර මඩවල මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීමේ කොන්ත්‍රාත්තුව රු.මිලියන 1,614.96 ක (එ.ජ.ඩොලර් 10.77) ඇස්තමේන්තුගත පිරිවැයකට ප්‍රදානය කර තිබුණු අතර කොන්ත්‍රාත් කටයුතු 2016 ජූලි 07 දින ආරම්භ කර තිබුණි. පසුව කොන්ත්‍රාත් කටයුතුවල | සැලසුම් කළ කාලය හා කොන්ත්‍රාත් පිරිවැය ඉහළ යා හැකිය. | කොන්ත්‍රාත්කරුගේ මූල්‍ය හා භෞතික ධාරිතාවයන් පිළිබඳවකොන්ත්‍රාත්තුව පිරිනැමීමට පෙර ඇගයීමට ලක් කිරීමට අපොහොසත් වීම. | කොන්ත්‍රාත්කරුගේ දුර්වල කාර්යසාධනය හේතුවෙන් 2017 සැප්තැම්බර් 06 දින කොන්ත්‍රාත්තුව අත්හිටුවන ලද අතර එදිනට භෞතික ප්‍රගතිය සියයට 14.62 ක් වූ අතර සැලසුම් කළ ප්‍රගතිය සියයට 53.14 ක් විය. කොන්ත්‍රාත් කටයුතු අත්හිටුවීමෙන් | ව්‍යාපෘතියෙහි අරමුණු ඉටුකර ගැනීම සඳහා ශක්තිමත් ව්‍යාපෘති කළමනාකරණ පද්ධතියක් ක්‍රියාත්මක කළ යුතුය. |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | පිළිවෙලින් සියයට 24 ක හා සියයට 14 ක මූල්‍ය හා භෞතික ප්‍රගතියක් සහිතව 2017 සැප්තැම්බර් 6 දින පිහිටුවා තිබුණු අතර කටයුතු අත්හිටුවන ලද දිනට රු.මිලියන 392.73 (එ.ජ.ඩොලර් මිලියන 2.62 ක්) වැයකර තිබුණි. එසේම, රු.මිලියන 28.16 ක් වන්දි ගෙවීම් කටයුතු සඳහා වැයකර තිබුණි. කොන්ත්‍රාත් කටයුතු අත්හිටුවා වර්ෂ 2 යි මාස 3 ක් ගත වූ පසුවද මේ සඳහා නැවත ටෙන්ඩර් කැඳවීමක් සිදුකර නොතිබුණි. මෙම නිසා අපේක්ෂිත අරමුණු හා ප්‍රතිඵල ව්‍යාපෘතියට ලබාකර ගත නොහැකි වී තිබුණි. | | | පසුව, නැවත වෙනත් කොන්ත්‍රාත්කරුවෙකු වැඩ ආරම්භ කරන තෙක් මහනුවර මඩවල මාර්ගය නඩත්තු කිරීමේ කටයුතු මාර්ග සංවර්ධන අධිකාරියට පවරා ඇත. | |
| (ආ) | මහනුවර බහුකාර්ය ප්‍රවාහන අංගනය ප්‍රතිසංස්කරණය කිරීම. | ව්‍යාපෘති කාලය තුළ කොන්ත්‍රාත් කටයුතු නිම කිරීමට හැකියාවක් නොමැති වීම | කළමනාකරණයේ දුර්වලතාවයන් නිසා සම්පූර්ණ ව්‍යාපෘති අරමුණු | නැවත පදිංචි කිරීමේ කටයුතු සහ නිර්මාණ සැලසුම් කටයුතු ප්‍රමාද | එකඟ වේ. අමාත්‍යාංශයේ හා විදේශ සම්පත් දෙපාර්තමේන්තු වේ | ව්‍යාපෘතියෙහි අරමුණු ඉටුකර ගැනීම සඳහා ශක්තිමත් ව්‍යාපෘති කළමනාකරණ |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | මත රු.මිලියන 247.19 ක් වැය කිරීමෙන් පසුවද, මහනුවර බහුකාර්ය ප්‍රවාහන අංගනය රු.මිලියන 10,500 ක (එ.ජ.ඩො.මිලියන 65) පිරිවැයකට ඉදිකිරීම් සඳහා මූල්‍යනය කිරීමේ කාර්යය ජාත්‍යන්තර සංවර්ධන සංගමය අත්හිටුවා තිබුණි. තවද, ව්‍යාපෘතිය මඟින් රු.මිලියන 605.40 ක් නැවත පදිංචි කිරීමේ සැලසුම යටතේ වන්දි වශයෙන් ගෙවා තිබුණි. | ලඟාකර ගැනීමට නොහැකි වන අතර මෙමඟින් ව්‍යාපෘති අරමුදල් අපතේ යාමක් සිදුවිය හැකිය. | වේ. | උපදේශයන් මත මහනුවර බහුකාර්ය ප්‍රවාහන අංගනය වෙනමම ව්‍යාපෘතියක් ලෙස ආරම්භ කිරීමට ලෝක බැංකුව තීරණය කර ඇත. | පද්ධතියක් ක්‍රියාත්මක කළ යුතුය. |
| (ඇ) | මහනුවර ධර්මාශෝක මාවත ප්‍රතිසංස්කරණය කිරීම | මහනුවර ධර්මාශෝක මාර්ගය ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව රු.මිලියන 796.43 ක (එ.ජ.ඩො.මිලියන 5.31) ඇස්තමේන්තුගත පිරිවැයකට 2016 ජූලි මස 07 දින ප්‍රදානය කර තිබුණු අතර එම ඉදිකිරීම් කටයුතු සමාලෝචිත වර්ෂයේදී නිම කිරීමට සැලසුම් කර තිබුණි. එසේ වුවත්, | ඉදිකිරීම් කටයුතුවල ප්‍රමාදයන් නිසා කොන්ත්‍රාත් පිරිවැය ඉහළ යා හැකි අතර ව්‍යාපෘති කාලය දීර්ඝ කිරීමටද සිදුවේ. | කොන්ත්‍රාත්කරුගේ මූල්‍ය හා භෞතික හැකියාව පිළිබඳ ඇගයීමට අසමත් වීම. | අවශ්‍ය සම්පත් නොමැති වීම නිසා උප ව්‍යාපෘතියෙහි ලඟා කරගත් භෞතික ප්‍රගතිය, සැලසුම් කළ භෞතික ප්‍රගතිය සමඟ සැසඳීමේ ඉතාමත් දුර්වල මට්ටමක පැවතුණි. පසුව කොන්ත්‍රාත්කරුගේ ප්‍රමාදයන් හා අඩුපාඩු නිරීක්ෂණය වූ අතර එම අඩුපාඩු නැවත | ව්‍යාපෘතියෙහි අරමුණු ඉටුකර ගැනීම සඳහා ශක්තිමත් ව්‍යාපෘති කළමනාකරණ පද්ධතියක් ක්‍රියාත්මක කළ යුතුය. |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | කොන්ත්‍රාත්රුගේ දුර්වල කාර්යසාධනය හේතුවෙන් 2019 ජුනි 14 දින මෙම කොන්ත්‍රාත්තුව අත්හිටුවා තිබුණි. එම දිනට කොන්ත්‍රාත්තුවේ මූල්‍ය හා භෞතික කාර්යසාධනය පිළිවෙලින් සියයට 66 ක් හා සියයට 25 ක් විය. | | | සකසන ලෙස සෑම මාසයකම උපදෙස් දෙන ලදී. | |
| (ඇ) | ගාල්ල නගර බල සීමාවේ මැදිහත් වීම් කටයුතු | ජලය රඳවා ගැනීමේ ප්‍රදේශ සහ ජල පාලන කාණු පද්ධතිය ගොඩනැංවීම | මොරගොඩ ඇල මාර්ගයෙහි ඉවුරු දිගේ පිහිටි ගංවතුර පාලනය කිරීමේ ස්ථාන 8 ක් උපදේශක සමාගම විසින් හඳුනාගෙන තිබුණි. තෙත්බිම් කළමනාකරණ සැලැස්මක් පිළියෙල කිරීමේ අරමුණින් මෙම ස්ථාන සංවර්ධනය කිරීම සඳහා අදාල ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු ඉටු කිරීමට ව්‍යාපෘතිය අපොහොසත් වී තිබුණි. බල ප්‍රදේශයේ පිහිටි ඉඩම් අත්පත් කර ගැනීමේ අධිකාරිය සහිත ආයතන සමඟ මනා සමායෝජනයක් | ව්‍යාපෘති සංරචකයෙන් ළඟාකර ගැනීමට අපේක්ෂා කළ ප්‍රතිලාභයන්, අවිධිමත් ව්‍යාපෘති කළමනාකරණය හේතුවෙන් ලබා ගැනීමට නොහැකි තත්ත්වයක් ඇති වීම. | ගාල්ල නගරයෙහි පිහිටි අදාල ආයතන අතර මනා සම්බන්ධීකරණයක් නොතිබීම. | ගාල්ල අපජල මාර්ග පද්ධතිය වැඩිදියුණු කිරීම සඳහා වූ මැදිහත් වීම් කටයුතු අදාල ප්‍රතිලාභීන්ගේ නියෝජිතායතන සමඟ සාකච්ඡා කිරීමෙන් පසුව වෙනස් කිරීමට සිදුවිය. සමාජීය හා ඉඩම් අත්පත් කර ගැනීමේ ගැටලු හේතුවෙන් හා ප්‍රායෝගිකව අවශ්‍ය සංවර්ධන කටයුතු ක්‍රියාත්මක කිරීමේ අපහසුතා හේතුවෙන් අදාල සැලසුම්ගත කාල රාමුව තුළ ඉලක්ක ළඟාකර | ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතුවලට අදාල වන අනෙකුත් රාජ්‍ය ආයතන සමඟ මනා සම්බන්ධීකරණය පවත්වා ගනිමින් ක්‍රියාත්මක කළ යුතුය. හඳුනාගත් මහජන අවශ්‍යතා කාර්යක්ෂම ව්‍යාපෘති කළමනාකරණ ක්‍රමවේදයන් මඟින් ඉටුකර දීමට කටයුතු කළ යුතුය. |

| | |
|---|---|
| නොතිබීම නිසා ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු අත්හිටුවා තිබුණි. මෙකී ඉඩම් අත්පත් කර ගැනීමේ ගැටලු හේතුවෙන් ගාලු නගරයෙහි ආරම්භ කිරීමට නියමිතව තිබුණු ගංවතුර පාලනය කිරීමේ කාණු පද්ධති 16 ක ඉදිකිරීම් අරම්භ කර නොතිබුණි. මෙම තත්ත්වය ව්‍යාපෘතියෙහි අරමුණු ඉටුකර ගැනීම කෙරෙහි සෘජුවම බලපා තිබුණි. | ගැනීමට බාධා ඇති විය. |

**3.2 කොන්ත්‍රාත් කළමනාකරණය**

--------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | බලපෑම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණනයේ නිර්දේශය |
|---|---|---|---|---|
| | ---------------------------- | ------------------ | ------------------------------ | -------------------------- |
| (අ) | ව්‍යාපෘතියෙහි කටයුතු ආරම්භ කර වර්ෂ 5 ක් ගත වීමෙන් පසුවද, වටිනාකම එ.ජ.ඩොලර් මිලියන 190.57 ක් වූ ඉදිකිරීම් භාණ්ඩ හා උපදේශන කොන්ත්‍රාත් 201 ක් පමණක් හඳුනාගෙන තිබුණි. ව්‍යාපෘති ගිවිසුමට අනුව, වටිනාකම එ.ජ.ඩොලර් මිලියන 91.94 ක් වූ උප ව්‍යාපෘති 21 ක් ක්‍රියාත්මක කිරීමට සුදානම් කරමින් පවතින අතර මෙය ව්‍යාපෘතියෙහි මුළු කොන්ත්‍රාත් වටිනාකමින් සියයට 45 ක් නියෝජනය කරනු ලබයි. එසේම, ව්‍යාපෘතියෙහි සමස්ථ පිරිවැය සමඟ සැසඳීමේදී කොන්ත්‍රාත් වටිනාකම එ.ජ.ඩොලර් මිලියන 21.37 ක් වූ | කොන්ත්‍රාත් කටයුතුවල ප්‍රමාදය හේතුවෙන් කොන්ත්‍රාත් පිරිවැය ඉහළ යා හැකි අතර ව්‍යාපෘති කාලය දීර්ඝ කිරීමට සිදු වේ. | උපදේශක සේවාවන් සඳහා හා වැඩකටයුතු භාරදීම සඳහා කොන්ත්‍රාත්කරුවන් තෝරා ගැනීමේදී ප්‍රතිලාභීන්ගේ නියෝජිතායතන සමඟ සහ රජයේ ආයතන සමඟ මැදිහත් වීමට උපාය මාර්ගික නගර සැලසුම් ව්‍යාපෘතියට සිදු වේ. පැහැදිලිව දැකිය නොහැකි බාධක හේතුවෙන් කොන්ත්‍රාත් තෝරා ගැනීම ප්‍රමාද විය. | වර්තමාන ප්‍රගතිය සමාලෝචනය කිරීමෙන් පසුව, ඉතිරි කොන්ත්‍රාත් කටයුතු කඩිනම් කිරීම සඳහා අවශ්‍ය නිවැරදි කිරීමේ කටයුතු ඉටුකළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | ඉදිකිරීම් කටයුතු 117 කින් සමාලෝචිත වර්ෂය තුළ සියයට 11 ක තරම් අඩු ප්‍රගතියක් වාර්තා කෙරුණි. හඳුනාගත් සමස්ථ කොන්ත්‍රාත් අතරින්, වටිනාකම එ.ජ.ඩොලර් 4.43 ක් වූ කොන්ත්‍රාත් 7 ක් ප්‍රසම්පාදන අදියරෙහි පැවතුණි. | | | |
| (ආ) | රු.මිලියන 1,452.13 ක ඇස්තමේන්තුගත පිරිවැයක් යටතේ ඉටු කිරීමට සැලසුම් කර තිබුණු මොරගොඩ ප්‍රධාන ඇළ ප්‍රතිසංස්කරණය කිරීමේ කොන්ත්‍රාත්තුව සඳහා ආයතන 5 ක් විසින් ලංසු ඉදිරිපත් කර තිබුණි. රු.මිලියන 844.99 කට කොන්ත්‍රාත්තුව ඉටු කිරීම සඳහා අවම මිල ඉදිරිපත් කර තිබුණු ලංසුකරුගේ ලංසුව ප්‍රමාණාත්මක මිල විචලනයන් හේතුවෙන් තාක්ෂණික ඇගයීම් කමිටුව ප්‍රතික්ෂේපකර තිබුණි. එම නිසා දෙවන අඩුම ලංසුකරු තෝරාගෙන තිබුණි. එසේවුවත්, ඉහත තීරණයට අනුගත නොවී, මුල් කොන්ත්‍රාත් ඇස්තමේන්තුව රු.මිලියන 1,039.11 දක්වා අඩුකර ප්‍රතික්ෂේප කරන ලද ලංසුකරු උපදේශකවරුන්ගේ උපදෙස්වලින් තොරව තෝරාගෙන තිබුණි. මෙපරිදි කොන්ත්‍රාත් කටයුතු 2019 වර්ෂයේදී නිම කිරීම පිණිස කොන්ත්‍රාත්තුව 2017 දී ප්‍රදානය කර තිබුණි. එසේවුවත්, කොන්ත්‍රාත්කරුගේ දුර්වල කාර්යසාධනය හේතුවෙන් රු.මිලියන 339 ක වියදම් දැරීමෙන් පසුව කොන්ත්‍රාත්තුව 2019 අප්‍රේල් 11 දින අත්හිටුවා තිබුණි. | කොන්ත්‍රාත්තුවේ නිමකළ යුතු කාලය දීර්ඝ කිරීමට සිදුවීම හේතුවෙන් ව්‍යාපෘතියේ සමස්ථ ඇස්තමේන්තුගත කාලය කෙරෙහි බලපෑම් කරනු ලබයි. | SCAPC ආයතනය ලබාදුන් උපදෙස් අනුව ඉංජිනේරු ඇස්තමේන්තුව සංශෝධනය කළ අතර මෙම පිරිවැය සංශෝධනයට අනුව අඩුම ලංසුකරු SPAPC ආයතනය විසින් පිළිගන්නා ලදී. | ප්‍රමාණ පත්‍රිකාවල ඇතුලත් අයිතමයන්වල මිල ගණන් කොන්ත්‍රාත් සඳහා කැඳවීම් කිරීමට පෙර විශ්ලේෂණය කළ යුතුය. |
| (ඇ) | ඉහත කොන්ත්‍රාත්තුවේ ඉතිරි වැඩ කොටස් මාස 15 කින් අවසන් කිරීම පිණිස, මිල කැඳවීමකින් තොරව සෘජු පදනම මත රු.මිලියන 736.02 මුදලකට ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව වෙත 2019 ජූනි 17 පවරා තිබුණි. එසේ වුවත්, ඉංජිනේරු ඇස්තමේන්තුවලට අනුව ඉතිරි වැඩ කොටස්වල වටිනාකම රු.මිලියන 463.08 ක් පමණක් විය. මේ අනුව, | මෙම තත්ත්වය රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය උල්ලංඝනය කිරීමට හේතු වන අතර මෙවැනි කටයුතු මහජන මුදල් | මිල විචලනයන් සැලකිල්ලට ගෙන ඉංජිනේරු ඇස්තමේන්තුව සංශෝධනය කළ අතර ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධන සංස්ථාවේ මිල රේටයන් සහ ඉංජිනේරු ඇස්තමේන්තුව අතර වෙනස්කම් එතරම් සැලකිය යුතු කරුණක් | කොන්ත්‍රාත් සඳහා පිළිගත් හැකි හා විශ්වාසදායී පිරිවැය ඇස්තමේන්තු සකස් කළ යුතු අතර කොන්ත්‍රාත් පිරිනැමීමට පෙර ප්‍රමාණ පත්‍රිකාවල ඇතුලත් අයිතමවල මිල ගණන් සමාලෝචනය කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 272.94 කින් ඉක්මවා කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර තිබුණු බව නිරීක්ෂණය විය. එසේම, ඇතැම් ප්‍රමාණ පත්‍රිකාවල සඳහන් අයිතම සඳහා සංස්ථාව ඉදිරිපත් කර තිබුණු මිල ගණන් සියයට 100 ත් ඉක්මවා ගොස් තිබුණි. මේ සම්බන්ධව මිල රේට විශ්ලේෂණයක් ව්‍යාපෘතිය මඟින් සිදුකර නොතිබුණි. | අයුතු පරිහරණය සඳහා පෙළඹවීමක් වේ. එසේම මෙමඟින් ව්‍යාපෘති පිරිවැය ඉහළ යා හැකිය. | නොවේ. | |
| (ඈ) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.5 (ඉ) වගන්තිය ප්‍රකාරව, අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීමකින් තොරව සෘජු කොන්ත්‍රාත් ක්‍රමය මත කොන්ත්‍රාත් පිරිනැමිය නොහැකි වුවත් ඉහත රෙගුලාසිය අනුගමනය කිරීමකින් තොරව මහනුවර ධර්මාශෝක මාවතේ බෑවුම් ස්ථායිකරණය කර ස්ථාවර කිරීමේ කොන්ත්‍රාත්තුවේ ඉතිරි වැඩ කොටස් නිම කිරීමේ කොන්ත්‍රාත්තුව ඉහත රෙගුලාසිය අනුගමනය කිරීමකින් තොරව රු.මිලියන 156.62 ක මුදලකට සමාලෝචිත වර්ෂය තුළ පවරා තිබුණි. එසේම, කොන්ත්‍රාත්තුවේ ඉංජිනේරු ඇස්තමේන්තුව රු.මිලියන 116.60 ක් වුවත්, එම ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 40.02 කින් ඉක්මවූ මිලකට කොන්ත්‍රාත්තුව පිරිනමා තිබුණි. | අධි පිරිවැය ඇස්තමේන්තු වංචාවලට අනුබල දෙන අතර, එය ව්‍යාපෘතියේ පිරිවැය කාර්යක්ෂමතාවය කෙරෙහි බලපානු ලබයි. | මෙම කොන්ත්‍රාත්තුව පිරිනැමීම සඳහා අනුගමනය කරන ලද ක්‍රමවේදය නිවැරදිය. ව්‍යාපෘති ප්‍රසම්පාදන කමිටුවට (PPC) මේ සඳහා අධිකාර බලය හිමි වේ. | නිවැරදි හා පිළිගත හැකි පිරිවැය ඇස්තමේන්තු සකස් කළ යුතු අතර පිරිවැය ඇස්තමේන්තු තාර්කික විය යුතුය. |
| (ඉ) | සමාලෝචිත වර්ෂය අවසානයට ව්‍යාපෘතිය මඟින් කොන්ත්‍රාත්කරුවන්ට ලබාදී තිබුණු වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම්වල එකතුව රු.මිලියන 1,350 ක් විය. මෙම අත්තිකරම්වලින් රු.මිලියන 608.49 ක මුදලක් වර්ෂ 3 කට වැඩි කාලයක සිට අයකර ගෙන නොතිබුණි. ව්‍යාපෘතිය මඟින් මෙම අත්තිකාරම් අයකර ගැනීමට ප්‍රමාණවත් පියවර නොගැනීම නිසා පිළිගත හැකි විශේෂිත හේතුවෙක් නොමැතිව ණය මුදල් උපයෝගී කරගෙන ලබාදී තිබුණු අත්තිකාරම් මුදල් කොන්ත්‍රාත්කරුවන් දීර්ඝ කාලයක් අත රඳවාගෙන තිබුණි. | මෙම තත්ත්වය රජයේ රෙගුලාසි උල්ලංඝනය කිරීමක් වන අතර මෙවැනි ක්‍රියාකාරකම් වංචා ඇති වීමට හා අරමුදල් අවභාවිතයට හේතුවන කරුණු වේ. | කොන්ත්‍රාත් ගිවිසුම්වල සඳහන් කොන්දේසිවලට අනුව, කොන්ත්‍රාත් වැඩවලින් සියයට 30 ක ප්‍රගතියක් ලබා කරගන්නා තුරු අත්තිකාරම් අයකර ගැනීම ආරම්භ කළ නොහැක. | ගිවිසුම් ප්‍රකාරව අයකර ගත යුතු අත්තිකාරම් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

### 3.3 නිෂ්කාර්ය හා ඌන උපයෝජිත සම්පත්

| විගණන නිරීක්ෂණය | බලපෑම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණනයේ නිර්දේශය |
| --- | --- | --- | --- |
| විගණනයට ලැබුණු තොරතුරුවලට අනුව, ණය ලබාදීමේ නියෝජිතායතනය මගින් ලබාදී තිබුණු රු.මිලියන 27,507 කට සමාන එ.ජ.ඩොලර් මිලියන 202 ක මුදලින්, ව්‍යාපෘතියේ කටයුතු ආරම්භ කර 2019 දෙසැම්බර් 31 දිනට වර්ෂ 5 ½ ක් ගතවූ පසුවද උපයෝජනය කර තිබුණේ එ.ජ.ඩොලර් මිලියන 55.05 කට සමාන රු.මිලියන 9,012.71 ක් හෙවත් මුළු ප්‍රතිපාදනයෙන් සියයට 27 ක් පමණි. එසේම ව්‍යාපෘති කටයුතුවල පැවති දුර්වල ප්‍රගතිය සහ ව්‍යාපෘතියෙහි දුර්වල මූල්‍ය පුරෝකථනයක් හේතුවෙන් රු.මිලියන 797.85 කට සමාන එ.ජ.ඩොලර් මිලියන 4.39 ක මුදලක් උපයෝජනය කිරීමකින් තොරව 2019 දෙසැම්බර් 31 දිනට විශේෂ (ඩොලර්) ගිණුමෙහි රඳවාගෙන තිබුණි. | සැලසුම් කළ කාල පරිච්ඡේදය තුළ ව්‍යාපෘතියෙහි කාර්යයන් නිම කිරීමට නොහැකි වීම. | අරමුදල් උපයෝජනය සම්බන්ධව ඉදිරිපත් කර ඇති අදහස් දැක්වීම් පිළිබඳ එකඟ වේ. එසේ වුවත්, සමස්ථ ව්‍යාපෘතියම ආවරණය කරනු ලබන සර්ව සම්පූර්ණ ක්‍රියාකාරී සැලසුමට ව්‍යාපෘතියේ කටයුතුවල ඇති අඩු ප්‍රගතියෙන් බලපෑමක් ඇති නොවේ. | ව්‍යාපෘති කාර්යයන් ඉටු කිරීමේදී ඇතිවිය හැකි අඩුපාඩු කාලීනව නිවැරදි කර ගැනීමේ අරමුණින්, ව්‍යාපෘතියේ කටයුතුවල තථ්‍ය කාර්යසාධනය සැලසුම් සමඟ සසඳා නියාමනය කිරීමට පියවර ගත යුතු අතර ප්‍රතිපාදිත මුදල් සම්පූර්ණයෙන් උපයෝජනය කිරීමට කටයුතු කළ යුතුය. |

### 3.4 මානව සම්පත් කළමනාකරණයට අදාළ නිරීක්ෂණ

ව්‍යාපෘතියෙහි අනුමත කාර්ය මණ්ඩලය විවිධ තනතුරුවලට අයත් තනතුරු 140 කින් සමන්විත වුවද, නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ සහ ජ්‍යෙෂ්ඨ ඉංජිනේරු යන ප්‍රධාන තනතුරු 12 ක්, සහකාර ව්‍යාපෘති අධ්‍යක්ෂ තනතුරු 16 ක් ඇතුලත් තනතුරු 43 ක් වර්ෂ 3 කට වැඩි කාලයක් පුරප්පාඩුව පැවති අතර එම තනතුරු පිරවීමට කටයුතු කර නොතිබුණි. එසේම, තවදුටත් නිරීක්ෂණය වූ පරිදි ව්‍යාපෘති නිලධාරීන් 78 දෙනෙකු 2014 වර්ෂයේ සිට සේවයෙන් ඉවත්ව ගොස් තිබුණි. ව්‍යාපෘතියෙහි කටයුතුවල පහල ප්‍රගතිය කෙරෙහි ඉහත දක්වන ලද කාර්ය මණ්ඩලය පුරප්පාඩු ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

## 3.5 පද්ධති හා පාලන

| විගණන නිරීක්ෂණය | බලපෑම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | විගණනයේ නිර්දේශය |
| --- | --- | --- | --- |
| ව්‍යාපෘතිය මඟින් සමාලෝචිත වර්ෂය තුලදී රු.මිලියන 3,761 ක ඇස්තමේන්තුගත පිරිවැයක් යටතේ ප්‍රසම්පාදන කටයුතු 11 ක් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණද, මෙකී ප්‍රසම්පාදනයන් සැලසුමට අනුකූලව සිදුකර නොතිබුණි. | ව්‍යාපෘතියේ කටයුතු ප්‍රමාදවීම හේතුවෙන් ව්‍යාපෘතිය නිම කිරීමේ කාලය දීර්ඝ කිරීමට සිදුවීම. | ඇතැම් ප්‍රසම්පාදන කාර්යයන් ව්‍යාපෘතියෙහි කෙරෙමින් පවතින ඇතැම් කාර්යයන්ට ආදේශ කරන ලදී. | සැලසුම් කළ ප්‍රසම්පාදන කාර්යයන් සැලසුම් කළ පරිදි කාලීනව ඉටු කිරීමට අවශ්‍ය පියවරගත යුතුය. |

## 3.6 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | බලපෑම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
| --- | --- | --- | --- |
| මෝටර් රථ කුලී පදනම මත ලබා ගැනීම සඳහා ව්‍යාපෘතිය එළඹ තිබුණු ගිවිසුමට අනුව, මසකට උපරිම වශයෙන් කිලෝමීටර් 2500 ක් ධාවනය කළ යුතු අතර ඊට වැඩිවන කිලෝමීටර් ප්‍රමාණය සඳහා අමතර ගාස්තුවක් ගෙවිය යුතු වේ. ව්‍යාපෘතිය මඟින් අමතරව කිලෝමීටර් 90,855 ක් වෙනුවෙන් රු.මිලියන 4.72 ක මුදලක් ගෙවන අතරතුර වෙනත් වාහන ධාවනය කළ යුතු උපරිම කිලෝමීටර් ප්‍රමාණය වූ කිලෝමීටර් 2500 ක ප්‍රමාණය ඉක්මවා ධාවනය කර නොතිබුණි. එසේම ලංසු කැඳවීමකින් තොරව ඉකුත් වර්ෂයේ තෝරාගත් සමාගම් දෙකකින් සමාලෝචිත වර්ෂය සඳහා කුලී පදනම මත මෝටර් රථ සමාගම් දෙකකින් වාහන ලබාගෙන තිබුණි. | මෝටර් රථ අයුතු ලෙස භාවිතා කළ හැකි වීම. | අලාභ හා අයුතු පරිහරණයන් අවම කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගනිමින් පවතී. | මෝටර් රථ ඇණියෙහි වාහන භාවිතා කිරීමේදී එහි ආර්ථිකමයභාවය, කාර්යක්ෂමතාවය හා ප්‍රතිඵල පිළිබඳව මෙන්ම එහි පිරිවැය පිළිබඳවද සැලකිලිමත් විය යුතුය. |